Academy of Wisdom & Enlightenment
(AWE) Date Posted: Jan 14, 2017
www.awe-edu.com

# World Buddhist leaders in SL to achieve four objectives

By Kanchana Kumara Ariyadasa



The 300 Buddhist leaders from 60 countries who represent the Association of World Buddhist Leaders for Cultural Exchange arrived in Sri Lanka on September 25, with the aim of achieving four objectives such as translating Sinhala Buddhist texts, making donations to propagate Buddhism, establishing a Buddhist Education Centre and organising a Buddhist Cultural League.

This special Buddhist tour was organised by China's Sangha Nayake Shih Da Yuan. Buddhist leaders from 16 Spanish spoken countries are also included this time, Singapore, Malaysia and Europe Chief Sangha Nayake Ven. Dr. Sumansiri Thera who has the oratory of 17 languages said. The venerable thera further said business tycoons in China and some other countries embraced Buddhism and arranged many programmes to propagate Buddhism in the world.

> "Business tycoons in China and some other countries have embraced Buddhism and arranged many programmes to propagate Buddhism"

The Buddhist leaders held a seminar in Kandy with the aim of fulfilling their

**MISSION**

objectives. They toured Dambulla and went to Anuradhapura afterwards where a Buddhist Teaching Centre is due to be opened.

They will stay in Sri Lanka until September 30.

Daily Mirror, 30.9.2013

# ලොව රටවල් 60 ක බෞද්ධ නායකයන් 300 ක් දිවයිනට






**එස්. කරුණාරත්න**

සංස්කෘතික හුවමාරුව සඳහා වූ ලෝක බෞද්ධ නායකයන්ගේ එකමුතුව නියෝජනය කරන ලොව රටවල් 60 ක බෞද්ධ නායකයන් 300 ක් පමණ දෙනා, අරමුණු හතරක් සාර්ථක කර ගැනීම සඳහා මේ දිනවල ලංකාවට පැමිණ සිටියි.

මෙම විශේෂ බෞද්ධ චාරිකාව චීනයේ සංඝනායක ෂී දා යුවන් (Shih Da Yuan) හිමියන් සංවිධානය කළ බවත්, ඉතිහාසයේ ප්‍රථම වතාවට ස්පාඤ්ඤ භාෂාව කතා කරන රටවල් 17 ක බෞද්ධ නායකයන් මෙම ගමනට එක්වී සිටින බවත් සිංගප්පූරුවේ, මැලේසියාවේ සහ යුරෝපයේ ප්‍රධාන සංඝනායක ආචාර්ය සිංගප්පූරුවේ සුමනසිරි නාහිමියෝ පැවසූහ.

පසුගිය 25 දින ලංකාවට පැමිණි 300 ක් වූ බෞද්ධ නායකයන් 30 දින දක්වා ලංකාවේ රැඳී සිටිමින් සිවු අරමුණු වන බෞද්ධ සිංහල ග්‍රන්ථ පරිවර්තනය කිරීමට ඇති හැකියාව, බුදු දහම ලොව පුරා ප්‍රචාරය සඳහා පූජ්‍යාධාර ලබාදීම, බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීම, සංස්කෘතිකමය බෞද්ධ එකමුතුවක් ඇතිකිරීම සඳහා ක්‍රියා සිදුකරන බව සුමනසිරි හිමියෝ පැවසූහ. සුමනසිරි හිමියෝ සිංගප්පූරු ජාතිකයෙකු වන අතර, භාෂා 17 පිළිබඳ චතුර කථිකත්වයක් ඇති භික්ෂුවකි. මෙම ධර්මදූත කණ්ඩායම මහනුවරදී තම අරමුණ පිළිබඳව ශ්‍රී ලංකා සම්මේලනයක් පැවැත් වූ අතර දඹුල්ල, අනුරාධපුරය ආදී බෞද්ධ සිද්ධස්ථානවලට ගොස් සොයා බැලීම්, වන්දනාමාන කිරීමට මෙන්ම අනුරාධපුරේ ඉදිකළ බෞද්ධ ඉගැන්වීම් මධ්‍යස්ථානය විවෘත කිරීමටද නියමිත බව මෙම සංවිධානයේ සභාපති චීන ජාතික චීන බෞද්ධ නායක ෂී දා යුවන් (Shih Da Yuan) හිමියෝ පැවසූහ.

මෙම ගමනට ශ්‍රී ලංකාවේ භාෂාවෙන් සඳහන් වන භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිවුවනක් පිරිස එක්ව සිටිති. ලෝකයේ රටවල් කිහිපයකම මෙන්ම චීනයේ ධනවතුන් රැසක් බෞද්ධ ආගම වැලඳගෙන බුදු දහම ප්‍රචලිත කිරීම සඳහා ලොව පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව සුමනරත්න හිමියෝ පවසති.

‘අද’, 30.9.2013